
FMM SRI LANKA
නිදහස් මාධ්‍ය ව්‍යාපාරය
சுதந்திர ஊடக இயக்கம்
Free Media Movement

# මාධ්‍ය නිදහසඃ නිරීක්ෂණ වාර්තාව
# ஊடக சுதந்திரம்: கண்காணிப்பு அறிக்கை
# Media Freedom Rights Monitoring Report

MFRMD

2021 ජුනි

කලාප අංක 06










මාධ්‍ය නිදහසට අදාළව ඒ ඒ මාසය තුළ වාර්තා වන සිදුවීම් හා පූර්ව සිදුවීම්වලට අදාළ වර්ධනයන්/පසු විපරම් සම්බන්ධ කෙටි වාර්තාකරණයක් සහ ඒවාට අදාළ නිරීක්ෂණ මෙම වාර්තාවට ඇතුළත් වේ. මාධ්‍යවේදීන්ගේ මෙන්ම ජනතාවගේ භාෂණයේ හා අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය සම්බන්ධ සිදුවීම් කෙරෙහිද මෙහිදී අවධානය යොමු කෙරේ. මාධ්‍ය නිදහස පිළිබඳව නිරීක්ෂණය කිරීම සඳහා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය තෝරා ගෙන ඇති විෂය පථයට/ සංරචකයන්ට අදාළ නව සිදුවීම් 12ක් 2021 ජුනි මාසය තුළ නිරීක්ෂණය විය. සිදුවීම් තුකකට අදාළව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ලිපි/ප්‍රවෘත්ති නිවේදන නිකුත් කළේය. තවත් සිදුවීමක් සම්බන්ධයෙන් නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළත් මාධ්‍ය සංවිධාන එකතුව ඊට අදළ නිලධාරියා වෙත විවෘත ලිපියක් යොමු කළේය.

## ජුනි මාසය තුළ වාර්තා වූ නව සිදුවීම්

1. කිසියම් පිරිසකගෙන් තමන්ට මරණ තර්ජන එල්ල වී ඇති බවට මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම විසින් කරන ලද ප්‍රකාශය සහ නීතිඥවරයකු ඔහුට එරෙහිව පැමිණිලි දෙකක් ඉදිරිපත් කිරීම.
2. ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් කරන ලද ආන්දෝලනාත්මක ප්‍රකාශය.
3. සමාජ මාධ්‍ය ඔස්සේ පළ කළ නිවේදනයක් හේතුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමයේ රජීව් යසිරු කුරුවිටගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගනු ලැබීම.
4. හිරු ප්‍රාදේශීය මාධ්‍යවේදී ප්‍රසාද් මුතුකුඩආරච්චි රාජකාරියේ නිරතව සිටියදී පොලිස් සැරයන්වරයකුගේ පහරදීමට ලක් වීම.
5. ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයාගේ සංචරණයට පොලිසිය බාධා කිරීම හා අවමන් සහගත ලෙස සැලකීම.
6. සමාජ මාධ්‍ය ඔස්සේ අසත්‍ය තොරතුරු පළ කරන්නන්

වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැකි බව අවධාරණය කරමින් පොලිස් මූලස්ථානය නිවේදනයක් නිකුත් කිරීම.

7. වසංගත තත්ත්වය හමුවේ ආර්ථික වශයෙන් දුෂ්කර තත්ත්වයට පත්ව සිටින ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා, රු. 5000 සහනාධාරය ලබා දෙන ලෙස මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය අගමැතිවරයාගෙන් ඉල්ලා සිටීම.

8. ජනමාධ්‍යවේදීන් සඳහා රජය මගින් එක් වසරක් සඳහා නොමිලයේ රක්ෂණාවරණයක් හඳුන්වා දීම.

9. GSP + සහනය ශ්‍රී ලංකාවට තවදුරටත් ලබා දිය යුතුද යන්න යළි සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් යුරෝපා පාර්ලිමේන්තුව සම්මත කළ යෝජනාවෙන්, ලංකාවේ අදහස් පළ කිරීමේ නිදහස, ජනමාධ්‍ය නිදහස හා සිවිල් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ සිදුවීම් පිළිබඳව අවධාරණය කිරීම.

10. rata.lk වෙබ් අඩවියේ පළ කළ පුවතක් සම්බන්ධයෙන් පොලිසිය එහි සංස්කාරකවරයාගෙන් ප්‍රශ්න කිරීම.

11. මාධ්‍ය ආයතන තුළදී තමන්ට සිදු වූ ලිංගික බලපෑම් පිළිබඳව මාධ්‍යවේදිනියන් කිහිපදෙනෙකු විසින් කරන ලද හෙළිදරව්වලින් පසුව ඒ පිළිබඳ කතිකාවක් ඇති වීම.

12. වසරකට වැඩි කාලයක් රැඳවුම් භාරයේ තබා සිටි අහ්නාෆ් ජසීම් තරුණ කවියා අධිකරණය වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කිරීම.

**වගු අංකඃ 01 වාර්තා වූ සමස්ත සිදුවීම් - 2021 ජුනි**

| අංකය | ආවරණය කර ඇති සංරචකය | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | ආරක්ෂාව සහ සුරක්ෂිතබව | 05 |
| 02 | නීතිමය කොන්දේසි | 04 |
| 03 | ව්‍යුහාත්මක කොන්දේසි | 03 |
| | **එකතුව** | **12** |

## මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව

**මාධ්‍යවේදීන්ට තම වෘත්තිය ශාරීරික සහ මානසික ඒකාග්‍රතාවකින් යුක්තව නිදහස් ලෙස කර ගෙන යෑමේ වාතාවරණයක් පැවතීම ජනමාධ්‍ය නිදහස පිළිබඳ මූලික කොන්දේසියකි. එමෙන්ම ජනමාධ්‍ය නිදහස හා අදහස් පළ කිරීමේ නිදහස ආරක්ෂා වීමට නම්, පුරවැසියන්ට අනිටු ප්‍රතිවිපාකවලට මුහුණදීමේ අවදානමකින් තොරව ජනමාධ්‍ය ඔස්සේ හෝ වෙනත් ආකාරවලින් නිදහසේ අදහස් පළ කළ හැකි වාතාවරණයක් පැවතිය යුතුය. මෙම මූලික නිදහස, බාහිර පාර්ශ්ව කෙරෙන් තර්ජනයට ලක් වූ අවස්ථා මෙන්ම, මාධ්‍ය ආයතන අභ්‍යන්තරයෙහි පවතින එම නිදහසට අහිතකර තත්ත්වයන් පිළිබඳ ප්‍රබල ලෙස අවධානයට ලක් වූ අවස්ථාවක්ද ජුනි මාසය තුළ නිරීක්ෂණය විය. එනම් වෘත්තීය පරිසරය තුළ දී තමන් ලිංගික හිංසනවලට ලක් වූ බවට මාධ්‍යවේදිනියන් කිහිපදෙනෙකු ට්විටර් ඔස්සේ හෙළිදරව් කිරීමෙන් පසුව ගොඩනැඟුණු සංවාදයයි. එමෙන්ම ඉහළ පෙළේ රජයේ නිලධාරියකු විසින් කරන ලද මාධ්‍යවේදීන්ගේ වෘත්තීය ගෞරවයට හානිකර සිත් රිදවනසුලු ප්‍රකාශයක්, එම නිලධාරියා කොන්දේසි විරහිතව ඉල්ලා අස් කර ගැනීම හා ඒ පිළිබඳව සමාව අයැදීමද විශේෂයෙන් කැපී පෙනුණු සිදුවීමකි.**

**වගු අංකඃ 02 - 2021 ජුනිඃ මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව සහ සුරක්ෂිතබව - සිදුවීම් 05**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | මාධ්‍යවේදීන්ට ශාරීරික ප්‍රහාර | 01 |
| 02 | සංචරණයේ සහ තොරතුරුවලට ප්‍රවේශ වීමේ අයිතිය | 01 |
| 03 | මානසික බලපෑම් | 03 |
| | **එකතුව** | **05** |

## මාසය තුළ නව සිදුවීම්:

1. **කිසියම් පිරිසකගෙන් තමන්ට මරණ තර්ජන එල්ල වී ඇති බවට මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රම විසින් කරන ලද ප්‍රකාශය සහ නීතිඥවරයකු ඔහුට එරෙහිව පැමිණිලි දෙකක් ඉදිරිපත් කිරීම.**

කිසියම් පිරිසකගෙන් තමන්ට මරණ තර්ජන එල්ල වී ඇති බවත්, එහෙත් ශ්‍රී ලංකා පොලිසිය කෙරෙහි විශ්වාසයක් නොමැති බැවින් ඒ පිළිබඳව පොලිසියට පැමිණිලි නොකළ බවත් ප්‍රකට රූපවාහිනී මාධ්‍යවේදියකු වන චමුදිත සමරවික්‍රම ජුනි 5 වැනිදා යූටියුබ් නාලිකාවක් සමඟ කළ සම්මුඛ සාකච්ඡාවකදී ප්‍රකාශ කළේය. ඔහු වැඩිදුරටත් ප්‍රකාශ කළේ, අදාළ තර්ජනය පිළිබඳ සියලු තොරතුරු ඇතුළත් ලිපියක්, එක් අයකු පමණක් දැනුවත්ව යම් තැනක තබා ඇති බවයි. (මූලාශ්‍රය:https://www.youtube.com/watch?v=pDm_AuGpuck)

හිරු රූපවාහිනී නාලිකාවේ වැඩසටහන් නිෂ්පාදකවරයකු මෙන්ම යූටියුබ් නාලිකා දෙකක ප්‍රධානියාද වන ඔහු, මෛත්‍රීපාල සිරිසේන හිටපු ජනාධිපතිවරයාගේ මාධ්‍ය අධ්‍යක්ෂවරයෙකු ලෙස ද කටයුතු කර ඇත

චමුදිතගේ ඉහත ප්‍රකාශය පදනම් කර ගනිමින් ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමය සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පොලිස්පතිවරයාට ලිපි දෙකක් යොමු කරමින් සිදු වී ඇතැයි කියන තර්ජනය පිළිබඳ පරීක්ෂණයක් සිදු කොට මාධ්‍යවේදියාගේ ආරක්ෂාව තහවුරු කරන මෙන් ඉල්ලා සිටියේය. (මූලාශ්‍ර 1. https://www.facebook.com/1283493888/posts/10226148417438603/ 2. නිදහස් මාධ්‍ය ව්‍යාපාරයේ නිවේදනය)

ජුනි 08 වැනිදා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ සංගමයේ නියෝජිතයකුගේ ප්‍රකාශයක් සටහන් කරගත් පොලිසිය ඒ පිළිබඳ පරීක්ෂණයක් ආරම්භ කළේය. (මූලාශ්‍රය: https://bit.ly/3w89ygd) පසුව මාධ්‍යවේදී චමුදිත සමරවික්‍රමද අදාළ සිදුවීම පිළිබඳව ඊමේල් මඟින් පොලිස්පතිවරයාට පැමිණිලි කර තිබුණු අතර ඒ අනුව ජුනි 09 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව ඔහුගෙන් ප්‍රකාශයක් ලබාගෙන තිබිණි.

මේ අතර, අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් චමුදිත සමරවික්‍රමට එරෙහිව නඩු පැවරීමට කටයුතු කරගෙන යන බව, නීතිඥ මංජු ශ්‍රී චන්ද්‍රසේන ප්‍රකාශ කළේය. නිරෝධායන නීති කඩ කරමින් උපන්දින සාදයක් පැවැත්වීම සම්බන්ධයෙන් අධිකරණය ඉදිරියේ චෝදනා ලැබ සිටින ප්‍රකට රූපලාවණ්‍ය ශිල්පී චන්දිමාල් ජයසිංහට ඇප ලබා දීම ගැන මාධ්‍ය ඔස්සේ කළ විවේචනයක් (මූලාශ්‍රය: https://bit.ly/3v7QuNM) මෙයට හේතු වී තිබේ. නීතිඥ මංජු ශ්‍රී චන්ද්‍රසේන, ඉහත නඩුවේදී චන්දිමාල් ජයසිංහ වෙනුවෙන් පෙනී සිටින නීතිඥවරයාය. මීට අමතරව, නිරෝධායන නීති කඩ කරමින් මුහුණු ආවරණයක් නොපැළඳ සම්මුඛ සාකච්ඡාවකට සහභාගී වීම පිළිබඳවද චමුදිත සමරවික්‍රමට එරෙහිව තවත් පැමිණිල්ලක් ගොනු කළ බව එම නීතිඥවරයා ප්‍රකාශ කර ඇත. (මූලාශ්‍රය: https://bit.ly/3v7QuNM)

2. **ඝාතනයට ලක් වූ මාධ්‍යවේදීන් සම්බන්ධයෙන් නියෝජ්‍ය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා විසින් කරන ලද ආන්දෝලනාත්මක ප්‍රකාශය.**

කොවිඩ් නිවාරණ වැඩපිළිවෙළ සම්බන්ධයෙන් ජුනි 03 වැනිදා සෞඛ්‍ය ප්‍රවර්ධන කාර්යාංශයේ පැවති මාධ්‍ය සාකච්ඡාවකින් අනතුරුව සිදු වූ විවාදාත්මක කතාබහකදී සෞඛ්‍ය සේවා නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්, විශේෂඥ වෛද්‍ය හේමන්ත හේරත් විසින් කරන ලද ආවේගාත්මක ප්‍රකාශයක් ඇතුළත් වීඩියෝවක් මාධ්‍යයෙහි පළ වීමත් සමඟ ඒ පිළිබඳ ආන්දෝලනයක් ඇති විය. එහිදී වෛද්‍ය හේරත් ප්‍රකාශ කරන්නේ පසුගිය සමයේ ඝාතනයට ලක්වූ මාධ්‍යවේදීන් වැඩි දෙනෙක් 'තර්ඩ් ක්ලාස් අය' බවයි. (මූලාශ්‍රය: https://bit.ly/3uWZVje)

මෙම ප්‍රකාශය සම්බන්ධයෙන් අදාළ නිලධාරියා වෙත යොමු කළ ලිපියක් මාධ්‍ය වෙතද නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයද ඇතුළු මාධ්‍ය සංවිධාන එකතුව, එම ප්‍රකාශය මාධ්‍ය ප්‍රජාවගේ මෙන්ම ඝාතනය වූ හා හිංසනයට ලක් වූ මාධ්‍යවේදීන්ගේ පවුල්වල අයට බලවත් සිත් තැවුල් ඇති කරවන්නක් බවත් ඝාතනය වූ මාධ්‍යවේදීන් කිසිවකු සම්බන්ධයෙන් තවමත් යුක්තිය ඉටු නොවී ඇති පසුබිමක එය වඩාත් බරපතළ කාරණයක් බවත් අවධාරණය කළේය. මාධ්‍ය සංවිධාන එකතුව වැඩිදුරටත් පෙන්වා දුන්නේ වගකිවයුතු නිලධාරියකු ලෙස ඔහු අදාළ ප්‍රකාශය සම්බන්ධයෙන් සමාව ගත යුතු බවයි. (මූලාශ්‍රය: https://bit.ly/3fXo2tH) ඝාතනයට ලක් වූ මාධ්‍යවේදී ලසන්ත වික්‍රමතුංගගේ දියණිය වන අහිම්සා වික්‍රමතුංගද මේ සම්බන්ධයෙන් සිය විරෝධය මාධ්‍ය ඔස්සේ පළ කර තිබිණි.

පසු දිනම මේ පිළිබඳව මාධ්‍ය වෙත ලිපියක් යොමු කරමින් වෛද්‍ය හේමන්ත හේරත් ප්‍රකාශ කළේ තමන් එම ප්‍රකාශය කොන්දේසි විරහිතව ඉල්ලා අස් කර ගන්නා අතර ඒ සම්බන්ධයෙන් සියලු පාර්ශ්වවලින් සමාව අයැද සිටින බවයි. වරද පෙන්වා දීම සම්බන්ධයෙන් මාධ්‍ය සංවිධාන එකතුවට ස්තුතිවන්ත වන බවද එම සංවිධාන එකතුව වෙත ලිපියට පිළිතුරු ලිපියක් යොමු කරමින් ඔහු ප්‍රකාශ කළේය.

3. **හිරු ප්‍රාදේශීය මාධ්‍යවේදී ප්‍රසාද් මුතුකුඩආරච්චි රාජකාරියේ නිරතව සිටියදී පොලිස් සැරයන්වරයකුගේ පහරදීමට ලක් වීම.**

ජුනි 08 වැනිදා සීදුව ලියනගේමුල්ල ප්‍රදේශයේ ඇඟලුම් කම්හලක සිදුවීමක් පිළිබඳව වාර්තාකරණයේ නිරතව සිටි හිරු නාලිකාවේ ප්‍රාදේශීය මාධ්‍යවේදී ප්‍රසාද් මුතුකුඩආරච්චිගේ රාජකාරියට බාධා කරමින් පොලිස්

සැරයන්වරයෙක් ඔහුට සහ කැමරාවට පහර දී ඇත.

ප්‍රසාද් හිරු නාලිකාවේ නිල වාර්තාකරුවකු වන අතර දෙරණ නාලිකාව, අරුණ පුවත්පත සහ තවත් මාධ්‍යවලට නිදහස් වාර්තාකරුවකු ලෙස සේවය කරයි.

අදාළ ඇඟලුම් කර්මාන්ත ආයතනයකට මිලදීගත් දර තොගයක්, අනවසරයෙන් ප්‍රවාහනය කළ ඒවා බවට ගම්පහ දිසා වන සංරක්ෂණ කාර්යාලයට ලැබුණු පැමිණිල්ලක් මත එම දර තොගය අත්අඩංගුවට ගැනීමට වන නිලධාරීන් එහි ගිය අවස්ථාව වාර්තා කරමින් සිටියදී, මාධ්‍යවේදියා මෙම සිදුවීමට මුහුණ පා ඇත. වාර්තාකරණය නතර කරන ලෙස අදාළ පොලිස් සැරයන්වරයා ප්‍රසාද්ට පවසා ඇති අතර එය ප්‍රතික්ෂේප කොට දිගටම කැමරාකරණයෙහි නිරත වීම නිසා මෙම පහරදීම සිදු කර තිබේ. පොලිස් නිලධාරියා වාහනයෙන් බැස විත් මාධ්‍යවේදියා ඉවතට තල්ලු කර කැමරාවේ මුහුණතට දෙවරක් පහර දෙන අයුරු එහි රූගත වී ඇති දර්ශනවලින් තහවුරු වේ. එම දර්ශන හිරු නාලිකාව මගින් ප්‍රචාරය කෙරිණි.

පසුදු (09) නි. පොලිස්පති දේශබන්දු තෙන්නකෝන් මාධ්‍යවේදී ප්‍රසාද්ට දුරකථනයෙන් අමතා, අදළ සිදුවීම සම්බන්ධයෙන් පොලිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන් ඔහුගෙන් සමාව ඉල්ලා තිබේ. එදිනම මීගමුව ජ්‍යෙ. පොලිස් අධිකාරී සමන් සිඟේරා, මේ පිළිබඳ ප්‍රකාශයක් ලබා දීමට පැමිණෙන ලෙස ප්‍රසාද්ට දැනුම් දී ඇති අතර එහිදී අදාළ සැරයන්වරයා ඔහුගෙන් සමාව ඉල්ලා ඇත.

ප්‍රායෝගික තත්ත්වය මත නීතිමය ක්‍රියාමාර්ගයකට නොගොස් සිදුවීම සමථයකට පත් කර ගැනීම හැර අන් විකල්පයක් නොවූ බව මාධ්‍යවේදී ප්‍රසාද් මුතුකුඩආරච්චි ප්‍රකාශ කරයි.

4. **ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ සභාපතිවරයාගේ සංචරණයට පොලිසිය බාධා කිරීම හා අවමන් සහගත ලෙස සැලකීම.**

ගුවන්විදුලි සංස්ථාවේ සභාපති ජයම්පති හීන්කෙන්ද කොළඹ සිට මහනුවර කරා ගමන් කරමින් සිටියදී කඩුගන්නාව ප්‍රදේශයේදී ප්‍රධාන පොලිස් පරීක්ෂකවරයකු ඔහුගේ සංචරණයට බාධා කොට අවමන්සහගත ලෙස සලකමින් රඳවා තබා ගත් බවට ඔහු ජනමාධ්‍ය ඇමතිවරයාට පැමිණිලි කර ඇත. තමන් රජයේ මාධ්‍ය ආයතනයක ප්‍රාධානියකු බවත්, රජයේ නිල රථයකින් රාජකාරී කටයුත්තක් සඳහා යමින් සිටින බවත් ජනමාධ්‍ය සේවාව සඳහා සංචරණ සීමා අදාළ නොවන බවත් පැහැදිලිව පෙන්වා දී තිබියදී මෙම බාධා කිරීම හා අවමන්සහගත සැලකීම සිදු ව තිබේ.

සංචරණ සීමා උල්ලංඝනය කළ බවට චෝදනා කරමින් පැය දෙකකට වැඩි කාලයක් තමන් රඳවාගෙන සිටි බවටද වැස්සක් ඇද හැළෙද්දී තෙමෙමින් සිටීමට සැලැස්වූ බවටද ඔහු ජනමාධ්‍ය ඇමතිවරයාට පැමිණිලි කර ඇත.

newscenter යූ ටියුබ් නාලිකාව මේ පිළිබඳව කෙහෙළිය රඹුක්වැල්ල ඇමතිවරයාගෙන් කළ විමසීමකදී ඔහු ප්‍රකාශ කළේ සිද්ධිය සම්බන්ධයෙන් නිල වශයෙන් ස්වාධීන විමර්ශනයක් පැවැත්වෙන බැවින් මේ මොහොතේ අදහස් පළ කිරීමෙන් වළකින බවයි. (මූලාශ්‍රය: https://bit.ly/3uZWqII)

සංචරණ සීමා හේතු ලෙස දක්වමින් ජනමාධ්‍යවෙදීන්ගේ කටයුතුවලට ආරක්ෂක අංශ බාධා කිරීමේ සිදුවීම් මින් පෙරද නිරීක්ෂණය විය.

5. **මාධ්‍ය ආයතන තුළදී තමන්ට සිදු වූ ලිංගික බලපෑම් පිළිබඳව මාධ්‍යවේදිනියන් කිහිප දෙනෙකු විසින් කරන ලද හෙළිදරව්වලින් පසුව ඒ පිළිබඳ කතිකාවක් ඇති වීම**

ශ්‍රී ලංකාවේ මාධ්‍ය ආයතන කිහිපයක් තුළ දී තමන් ලිංගික හිංසනවලට ලක් වූ බවට දේශීය හා විදේශීය මාධ්‍යවේදිනියන් කිහිපදෙනෙකු විසින් ට්විටර් ඔස්සේ කරන ලද හෙළිදරව් කිරීම් පිළිබඳව පරීක්ෂණයක් කළ හැකි බව ජුනි 22 වැනිදා ජනමාධ්‍ය ඇමති කෙහෙළිය රඹුක්වැල්ල ප්‍රකාශ කළ නමුත් එවැනි පරීක්ෂණයක් ආරම්භ කිරීමට කටයුතු සිදු නොවීය (මූලාශ්‍රය: https://twitter.com/srilankatweet/status/1407242392609071105?s=24

මෙම කතිකාව ආරම්භ වූයේ, ශ්‍රී ලාංකීය මාධ්‍යවේදිනියක විසින් ජුනි 18 වැනිදා පළ කළ ට්විටර් පණිවුඩ කිහිපයකිනි. ඇය 2020-17 වකවානුවේ නම සඳහන් නොකළ පුවත්පත් ආයතනයක සේවය කරමින් සිටියදී තම ජ්‍යෙෂ්ඨ මාධ්‍ය සගයකු විසින් තමන් දූෂණය කරන බවට තර්ජනය කරන ලද බවත් දිගු කලක් එම කම්පනයෙන් හා බියෙන් පසු වූ බවත් ඇය පවසා තිබිණි.

එම හෙළිදරව්වෙන් පසු, වසර 4කට පෙර ශ්‍රී ලංකාවේ ප්‍රමුඛ ඉංග්‍රීසි පුවත්පතක සීමාවාසික පුහුණුවක නිරතව සිටි එක්සත් ජනපදයේ මාධ්‍යවේදිනියක ද, ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියකුගෙන් තමන්ට විඳින්නට සිදු වූ ලිංගික හිංසනය පිළිබඳ අත්දැකීම් හෙළි කළ අතර ඒ පිළිබඳ සාක්ෂි වශයෙන් එම වකවානුවට අදළ සිය දින සටහන්වල උපුටනයන්ද පළ කළාය. එමෙන්ම #MeToo ව්‍යාපාරය වෙත සවිස්තරාත්මකව සිය අත්දැකීම් හෙළි කළාය. (මූලාශ්‍රය: https://twitter.com/jordanasophie/status/1406978176975245314?s=24) පසුව එම මාධ්‍යවේදියාගේ හිංසනයට ලක් වූ තවත් විදෙස් මාධ්‍යවේදිනියකද සිය අත්දැකීම් හෙළි කර ඇත. තරුණ සමාජ ක්‍රියාකාරිනියකද වන නිදහස් මාධ්‍යවේදිනියකද රූපවාහිනී මාධ්‍ය ආයතන දෙකකදී තමන්ට මුහුණපෑමට සිදු වූ ලිංගික හිංසනය පිළිබඳ අත්දැකීම් ද එයට එක් කර තිබුණි.

මෙම සිදුවීම් පිළිබඳව නිවේදනයක් නිකුත් කළ ශ්‍රී ලංකා විදෙස් ජනමාධ්‍යවේදීන්ගේ සංගමය වින්දිත මාධ්‍යවේදිනියන් වෙත සිය සහයෝගය පළ කළ අතර ඒ පිළිබඳ විමර්ශනයක් සිදු විය යුතු බව අවධාරණය කර තිබුණි ශ්‍රී ලංකා තරුණ ජනමාධ්‍යවේදීන්ගේ

සංගමය ප්‍රවෘත්ති අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිපියක් යොමු කරමින් මේ පිළිබඳ පරීක්ෂණයක් සිදු කරන ලෙසත්, මාධ්‍ය ආයතන තුළ මාධ්‍යවේදීනියන්ට හිතකර වෘත්තීය පරිසරයක් ඇති කිරීම පිළිබඳව මාධ්‍ය ප්‍රධානීන් දැනුවත් කරන ලෙසත් ඉල්ලා තිබුණි (මූලාශ්‍රය: https://bit.ly/3jxLArw). ප්‍රගතිශීලී කාන්තා එකමුතුවද මේ සම්බන්ධයෙන් නිවේදනයක් නිකුත් කළේය. (මූලාශ්‍රය: https://bit.ly/35QpU1K)

## නීතිමය කොන්දේසි

**මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි පිළිබඳ සංරචකය යටතට ගැනෙන සිදුවීම් 4ක් ජුනි මාසය තුළ නිරීක්ෂණය විය. එම සිදුවීම්වලින් එකක් අදහස් පළ කිරීමේ පුරවැසි නිදහසට එරෙහිව නිසි පරීක්ෂාවකින් තොරව නීතිමය ක්‍රියාමාර්ග ගැනීමක් වන අතර, තවත් සිදුවීමක් අදහස් පළකිරීමේ නිදහස ඇතුළුව ජනමාධ්‍ය නිදහසට තර්ජනයක් විය හැකි පරිදි පවතින නීති රීති භාවිත වීමේ ප්‍රවණතාවක් පිළිබඳ අනතුරු අඟවන්නකි. මාධ්‍ය නිදහසට අදාළව නීතිමය කොන්දේසි යන සංරචකය යටතේ සලකා බැලෙන එක් දර්ශකයක් වන 'ජනමාධ්‍යවේදීන්ගේ මූලාශ්‍රවල ආරක්ෂාවට ගරු කිරීම' යන්න සෘජුවම නියෝජනය කරන සිදුවීමක්ද නිරීක්ෂණය විය. සිව්වැනි සිදුවීම මින් පෙර වාර්තා වූ සිදුවීමකට අදාළ වර්ධනීය අවස්ථාවකි.**

**වගු අංකः 03 - 2021 ජුනි: නීතිමය කොන්දේසි - සිදුවීම් 04**

| අංකය | සිදුවීම | සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | නීතිමය ක්‍රියාමාර්ග ගැනීම | 02 |
| 02 | ජනමාධ්‍යවේදීන්ගේ මූලාශ්‍රවල ආරක්ෂාවට ගරු කිරීම | 01 |
| 03 | මාධ්‍යයට නීතිමය සීමා කිරීම් | 01 |
| | **එකතුව** | **04** |

## මාසය තුළ නව සිදුවීම්:

1. **සමාජමාධ්‍ය ඔස්සේ පළ කළ නිවේදනයක් හේතුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමයේ රජීව් යසිරු කුරුවිටගේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ කණ්ඩායමක් විසින් අත්අඩංගුවට ගනු ලැබීම.**

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමයේ (ITSSL) සභාපති රජීව් යසිරු කුරුවිටගේ මැතිව් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් යැයි හඳුන්වාදුන් කණ්ඩායමක් විසින් ජුනි 7වැනිදා සවස අත්අඩංගුවට ගැනිණි. ඔහුගේ ජංගම දුරකථනය හා ලැප්ටොප් පරිගණකයද අත්අඩංගුවට ගෙන තිබේ. ඔහු අත්අඩංගුවට ගත් අවස්ථාවේ ඊට හේතු ලෙස පෙන්වා දී ඇත්තේ, වට්ස්ඇප් භාවිතය පිළිබඳව ඉහත සංගමය නමින් පළ කළ නිවේදනයක් සම්බන්ධයෙන් TRC ආයතනය කළ පැමිණිල්ලක් මත අත්අඩංගුවට ගන්නා බවයි.

එහෙත් පසුවදා (8) පොලිස් මාධ්‍ය ප්‍රකාශකවරයා ප්‍රකාශ කළේ ප්‍රමුඛ පෙළේ රජයේ ආයතන රැසක වෙබ් අඩවිවලට දැවැන්ත සයිබර් ප්‍රහාරයක් එල්ල වීමට ඉඩ ඇති බවට නිවේදනයක් පළ කළේය යන චෝදනාව මත ඔහු අත්අඩංගුවට ගත් බවයි. (මූලාශ්‍රය: https://bit.ly/3zdeouL )

ඉහත චෝදනාව සම්බන්ධයෙන් යසිරු 6 වැනිදා අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට කැඳවා තිබූ අතර නීතිඥයකු සමග ගොස් කටඋත්තරයක් ලබා දී තිබිණි. ඉන් අනතුරුව ඔහු අදාළ නිවේදනය සම්බන්ධයෙන් ITSSL ෆෙස් බුක් පිටුවේ නිවැරදි කිරීමක් පළ කර තිබිණි.

අත්අඩංගුවට ගත් රජීව්, 8 වැනිදා කොළඹ කොටුව අතිරේක මහේස්ත්‍රාත්වරිය (රජින්ද්‍රා ජයසූරිය) වෙත ඉදිරිපත් කරමින් පොලිසිය අධිකරණයට වාර්තා කර ඇත්තේ සැකකරු පරිගණක අපරාධ පනතේ අංක 6, 10, 2 වගන්ති කඩ කර ඇති බවයි. සැකකරු පසුදින දක්වා (9) දක්වා රක්ෂිත බන්ධනාගාරගත කරන ලෙසත් 09 වැනිදා ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරන ලෙසත් එහිදී නියෝග කෙරිණි. (මූලාශ්‍රය: https://bit.ly/357It0F)

09 වැනිදා විත්තිකරු ප්‍රධාන මහේස්ත්‍රාත්වරයා (බුද්ධික ශ්‍රී රාගල) වෙත ඉදිරිපත් කෙරුණු අතර එහිදී ඔහුගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිටි නීතිඥ තිෂ්‍ය වේරගොඩ ඇතුළු නීතිඥවරුන් පෙන්වා දුන්නේ පරිගණක අපරාධ පනත යටතේ සැකකරුට එරෙහිව චෝදනා ඉදිරිපත් කළද ඔහු කළේ යැයි කියන වැරදි එම පනත යටතට නොගැනෙන බවයි. එහිදී වෙනත් පනතක් යටතේ චෝදනා ඉදිරිපත් කරන තෙක් ඔහු රිමාන්ඩ්

භාරයට පත් කරන ලෙස පොලිසිය අධිකරණයෙන් ඉල්ලා සිටි නමුත් එය ප්‍රතික්ෂේප කළ මහේස්ත්‍රාත්වරයා විත්තිකරු ඇප මත මුදාහැරීමට නියෝග කළේය.

එහෙත් PCR පරීක්ෂණයේ ප්‍රතිඵල ලැබෙන තෙක් ඔහු මුදාහැරීම බන්ධනාගාරය ප්‍රතික්ෂේප කළේය. ඊට විරෝධය පළ කරන විත්තිකරුගේ නීතිඥයින් ප්‍රකාශ කරන්නේ පීසීආර් පරීක්ෂණ සිදු කිරීම හෝ නිරෝධායනය සම්බන්ධයෙන් සෞඛ්‍ය අංශවලට තීරණයක් ගත හැකි නමුත් අධිකරණයෙන් ඇප ලබා දුන් පුද්ගලයෙකු යළි බන්ධනාගාරය යටතට පත්කිරීමට සෞඛ්‍ය අංශවලට හෝ බන්ධනාගාර නිලධාරීන්ට නොහැකි අතර එය නීති විරෝධී රඳවා තබා ගැනීමක් බවයි.

ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ සංගමය (ITSSL) හා එහි සභාපතිවරයාගේ ක්‍රියාකාරකම්වල වගකීම් සහගත බව සම්බන්ධයෙන් විවාදාත්මක තත්ත්වයක් පවතී. මෙය තනි පුද්ගලයකු සංවිධානයක් ලෙස පෙනී සිටීමක් ලෙස විවේචනයට ලක්ව ඇතත්, ප්‍රමුඛ ජනමාධ්‍ය එම සංවිධානය උපුටා දක්වමින් කලක සිට පුවත් පළ කර ඇත. (මූලාශ්‍රය: ITSSL සංවිධානය ගැන විකිපීඩියා සටහන https://bit.ly/2TbKHJH)

2. **rata.lk වෙබ් අඩවියේ පළ කළ පුවතක් සම්බන්ධයෙන් පොලිසිය එහි සංස්කාරකවරයාගෙන් ප්‍රශ්න කිරීම.**

මාධ්‍යවේදී සජීව විජේවීර සිය කර්තෘත්වයෙන් පවත්වා ගෙන යන rata.lk වෙබ් අඩවියේ පළ කළ ලිපියකට අදාළ මූලාශ්‍ර හෙළි කරන මෙන් බලපෑම් කෙරෙන පැමිණිල්ලක් කරාපිටිය ශික්ෂණ රෝහලේ අධ්‍යක්ෂවරයා විසින් ගාල්ල මූලස්ථාන පොලිසියේ ගොනු කෙරුණු අතර පොලිසිය ජූනි 17 වැනිදා සජීව විජේවීරගෙන් ප්‍රකාශයක් සටහන් කර ගත්තේය.

“කොරෝනා වැඩ මඟ හැර ලකුණු දමා ගන්නා දොස්තරලා” මැයෙන් අදාළ වෙබ් අඩවියේ පළ කරන ලද ලිපිය (මූලාශ්‍රය: https://bit.ly/367EKRy) සම්බන්ධයෙන් රෝහල් අධ්‍යක්ෂ වෛද්‍ය ෂෙල්ටන් පෙරේරා එම පැමිණිල්ල සිදු කර ඇති අතර එම ලිපියට මූලාශ්‍ර වූ, රෝහල අභ්‍යන්තරයෙහි හුවමාරු වූ ලිපියක් මාධ්‍යවේදියාට ලැබුණු ආකාරය විමර්ශනය කරන ලෙස පැමිණිල්ලෙන් ඉල්ලා තිබේ.

මේ සිදුවීම හෙළා දකිමින් නිවේදනයක් නිකුත් කළ නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කළේ, තොරතුරු මූලාශ්‍ර හෙළිදරව් කරන මෙන් මාධ්‍යවේදීන්ට බලපෑම් කිරීම මාධ්‍ය නිදහසට තර්ජනයක් මෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතියටද තර්ජනයක් බවයි. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 36 වන වගන්තිය උල්ලංඝනය කිරීමට මෙම පැමිණිල්ල සිදු කිරීමෙන් රෝහල් අධ්‍යක්ෂවරයා චේතනාන්විතව කටයුතු කර ඇති බවත්, එමෙන්ම අදාළ පනතේ 40 වැනි වගන්තියෙන් සහතික කර ඇති ‘අකටයුතු නාදකයන්ගේ’ ආරක්ෂාව තර්ජනයට ලක් කර ඇති බවත් එමගින් පෙන්වා දී තිබේ.

ශ්‍රී ලංකා තරුණ මාධ්‍යවේදීන්ගේ සංගමයද මේ සම්බන්ධයෙන් පොලිස්පති චන්දන වික්‍රමරත්න මහතාට ලිපියක් යොමු කරමින් මාධ්‍යවේදියකුට තොරතුරු ලැබුණු ආකාරය ගැන විමර්ශනය කිරීම බරපතළ තත්ත්වයක් බවද එය ජනමාධ්‍යවේදීන්ගේ වෘත්තීය කටයුතුවල දැවැන්ත බාධාවක් මෙන්ම තොරතුරු දැනගැනීමේ අයිතිය උල්ලංඝනය කිරීමක් බවද අවධාරණය කළේය. (මූලාශ්‍රය: https://bit.ly/3glr0Bo)

3. **සමාජමාධ්‍ය ඔස්සේ අසත්‍ය තොරතුරු පළ කරන්නන් වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැකි බව අවධාරණය කරමින් පොලිස් මූලස්ථානය නිවේදනයක් නිකුත් කිරීම.**

සමාජ මාධ්‍ය ඔස්සේ අසත්‍ය තොරතුරු පළ කරන පුද්ගලයින් ඊට අදාළ නීතිමය තත්ත්වයන්ට අනුව වරෙන්තු නොමැතිව අත්අඩංගුවට ගත හැකි බව පොලිස් මූලස්ථානය 2021-06-08 වැනිදා නිවේදනයක් නිකුත් කරමින් ප්‍රකාශ කළේය.

ඒ අනුව,

- ලංකා දණ්ඩ නීති සංග්‍රහයේ 120, 286, 286 අ, 291 අ, 291 ආ, 345, 365 ඇ, 402, 403 හා 486 වගන්ති,
- 2007 අංක 56 දරන සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබද ජාත්‍යන්තර සම්මුතිය පනතේ 3 වන වගන්තිය,
- 2007 අංක 24 දරන පරිගණක අපරාධ පනතේ 6 වෙනි වගන්තිය,
- 1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැළැක්වීමේ තාවකාලික විධිවිධාන පනතේ 3 සහ 3 වගන්ති,
- 1927 අංක 04 දරන අසභ්‍ය ප්‍රකාශන පනතේ 02 වගන්තිය යන වගන්ති යටතේ එවැනි පුද්ගලයින් අත්අඩංගුවට ගන්නා බව එම නිවේදනයේ සඳහන් වේ.

මහජනතාවගේ අදහස් පළ කිරීමේ අයිතියට ශ්‍රී ලංකා පොලිසිය ගරු කරන බවද නිදහස් මාධ්‍ය භාවිතයට බාධා කිරීම හෝ මර්දනය කිරීම කිසිසේත්ම අපේක්ෂා නොකරන බවද අදාළ නිවේදනයේම සඳහන් වන නමුත් සමාජ මාධ්‍යවල පළ වන විවේචනාත්මක අදහස් මර්දනය කිරීම සඳහා රජය මෑතක සිට අනුගමනය කරමින් සිටින ක්‍රියාමාර්ගවලම දිගුවක් ලෙස මෙම නිවේදනය සැලකිය හැකිය.

මේ පිළිබඳව නිවේදනයක් මගින් ප්‍රතිචාර දක්වන ශ්‍රී ලංකා නීතිඥ සංගමය, මහජනතාවගේ කතා කිරීමේ හා ප්‍රකාශනයේ නිදහස සහ විරුද්ධ වීමේ හා එකඟ නොවීමේ නිදහස ආරක්ෂා කිරීම අත්‍යාවශ්‍ය බවත් අව්‍යාජ විරෝධාකල්ප හා විවේචන මර්දනය කිරීම සඳහා

බලධාරීන් නීති භාවිත නොකරන බව සහතික කිරීම වැදගත් බවත් අවධාරණය කළේය. නීතිඥ සංගමය වැඩිදුරටත් සඳහන් කරන්නේ ව්‍යාජ පුවතක් වන්නේ හෝ නොවන්නේ කුමක් ද යන්න හා පුද්ගලයින් අත්අඩංගුවට ගැනීමට හා රඳවා ගැනීමට තීරණය කිරීම සම්බන්ධයෙන් වන පදනම පිළිබඳව තම සංගමය සැලකිලිමත් බවයි. (මූලාශ්‍රය: https://bit.ly/2TqShRo)

මේ අතර 'අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ වසංගතය සමඟ කටයුතු කිරීමේදී අවධානමට ලක්විය හැකි කණ්ඩායම් ආරක්ෂා කරන ලෙස' රජයට අවධාරණය කරමින් සංවිධාන හා වෘත්තීය සමිති 54ක් සහ සමාජ ක්‍රියාකාරීන් 72 දෙනෙකු විසින් ඒකාබද්ධ නිවේදනයක් නිකුත් කෙරිණි. පොලිසියේ ක්‍රියාමාර්ග මගින් අදහස් පළ කිරීමේ නිදහසට ඇති විය හැකි බලපෑම සම්බන්ධයෙන් දැඩි අවධානය යොමු කරන බව එම නිවේදනයෙහි දැක්වේ. (මූලාශ්‍රය: https://bit.ly/3zmtKgs)

4. **වසරකට වැඩි කාලයක් රැඳවුම් භාරයේ තබා සිටි අහ්නාෆ් ජසීම් තරුණ කවියා අධිකරණය වෙත ඉදිරිපත් කර රක්ෂිත බන්ධනාගාරගත කිරීම.**

අන්තවාදී අදහස් ප්‍රවර්ධනය කරන කවි පොතක් ප්‍රකාශයට පත් කළේය යන චෝදනාව සහ තවත් චෝදනා මත වසරකට අධික කාලයක් කොළඹ ත්‍රස්ත මර්දන හා විමර්ශන කොට්ඨාසයේ රඳවාගෙන සිටි දෙමළ භාෂා ගුරුවරයකු හා කවියකු වන අහ්නාෆ් ජසීම් ජුනි 12 වැනිදා කොළඹ අංක 8 මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කෙරිණි. ඔහු අධිකරණයට ඉදිරිපත් කරන බව අහ්නාෆ්ගේ පවුලේ අයට හෝ නීතිඥවරුන්ට දැනුම් දී නැති අතර විත්තිකරු ජුනි 22 වැනිදා දක්වා රක්ෂිත බන්ධනාගාරගත කිරීමට මහේස්ත්‍රාත්වරයා නියෝග කොට තිබේ.

22 වැනිදා අහ්නාෆ් කොළඹ අතිරේක මහේස්ත්‍රාත් චන්දිම ලියනගේ මහතා හමුවට ඉදිරිපත් කෙරුණු අතර 12 වැනිදා නීතිඥයින්ටද නොදන්වා ඔහු අධිකරණයට ඉදිරිපත් කිරීම පිළිබඳව අහ්නාෆ්ගේ නීතිඥයින් අධිකරණයට කරුණු ඉදිරිපත් කර තිබේ. ඒ අනුව ඔහුට නීතිඥයන් හමු වීමට අවස්ථාව සලසන ලෙස මහේස්ත්‍රාත්වරයා බන්ධනාගාරයට නියෝග කර ඇත.

TID නඩු අංක No. B 44230/08/20 දරන මෙම නඩුව ජුනි 29 වැනිදා යළි කැඳවූ අතර අහ්නාෆ්ට එරෙහි සාක්ෂි පිළිබඳ වාර්තාවක් ජූලි 06 වැනිදා ඉදිරිපත් කරන ලෙස මහේස්ත්‍රාත්වරයා TID වෙත නියෝග කළේය.

TID විසින් 2012/06/12 දින ගොනු කරන ලද වැඩිදුර වාර්තාවෙන් සිසුන් අන්තවාදයට පෙළඹවූ බවට අහ්නාෆ්ට එරෙහිව තවත් චෝදනා නඟා ඇති බවත්, 'නවරසම්' නම් ඔහුගේ කාව්‍ය කෘතිය මගින් සිසුන් ප්‍රචණ්ඩත්වයට පොළඹවන බවට චෝදනා කිරීම සඳහා මනෝචිකිත්සක වාර්තාවක් ඉදිරිපත් කර ඇති බවත් අහ්නාෆ් වෙනුවෙන් පෙනී සිටින නීතිඥ සංජය විල්සන් ජයසේකර ප්‍රකාශ කරයි.

## ව්‍යුහාත්මක කොන්දේසි

**'ව්‍යුහාත්මක කොන්දේසි' යන්න, මාධ්‍ය නිදහස පිළිබඳව සලකා බැලෙන තවත් වැදගත් සංරචකයකි. මාධ්‍ය පද්ධතියේ සමස්ත ව්‍යුහයට මෙන්ම මාධ්‍ය නිදහස සක්‍රිය කරන සමස්ත පරිසරයට අදාළ වන විභව දර්ශක 6ක් මෙම මානයට ඇතුළත්ය. ඒ අතරින් 'අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' හා 'රජය මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය' යන දර්ශකවලට අයත් වන සිදුවීම් තුනක් ජුනි මාසය තුළ දී නිරීක්ෂණය විය.**

**වගු අංක: 04 - 2021 ජුනි: ව්‍යුහාත්මක කොන්දේසි - සිදුවීම් 03**

| අංකය | සිදුවීම | වාර්තා වූ සිදුවීම් සංඛ්‍යාව |
|---|---|---|
| 01 | අධීක්ෂණ කණ්ඩායම් මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 01 |
| 02 | රජය මගින් මාධ්‍ය නිදහසට ක්‍රියාකාරී සහාය | 02 |
| | **එකතුව** | **03** |

1. **GSP+ සහනය ශ්‍රී ලංකාවට තවදුරටත් ලබා දිය යුතුද යන්න යළි සමාලෝචනය කිරීම සම්බන්ධයෙන් යුරෝපා පාර්ලිමේන්තුව සම්මත කළ යෝජනාවෙන්, ලංකාවේ අදහස් පළ කිරීමේ නිදහස, ජනමාධ්‍ය නිදහස හා සිවිල් අයිතිවාසිකම් උල්ලංඝනය කිරීමේ සිදුවීම් පිළිබඳව අවධාරණය කිරීම.**

යුරෝපා පාර්ලිමේන්තුව 2021 ජුනි 10 වැනිදා සම්මත කර ගත් යෝජනාවක් මගින්, ශ්‍රී ලංකාවේ අදහස් පළ කිරීමේ නිදහස, ජනමාධ්‍ය නිදහස ඇතුළුව පොදුවේ මානව හිමිකම් ආරක්ෂා කිරීම පිළිබඳ වත්මන් තත්ත්වය පිළිබඳව ගැඹුරින් සලකා බැලුණු අතර එම තත්ත්වය අයහපත් බැවින් GSP+ සහනය ශ්‍රී ලංකාවට තවදුරටත්

ලබා දිය යුතුද යන්න යළි සමාලෝචනය කළ යුතු බව තීරණය විය. යෝජනාව පිළිබඳ ඡන්ද විමසීමේදී ඡන්ද 683 කින් 628ක්ම යෝජනාවට පක්ෂව ලැබුණු අතර විපක්ෂව ලැබී ඇත්තේ ඡන්ද 15ක් පමණි. (මූලාශ්‍රය: https://bit.ly/2Tq8SV1)

ඉහත යෝජනාව මගින් යුරෝපා පාර්ලිමේන්තුව ජීඑස්පී+ සඳහා ශ්‍රී ලංකාවේ සුදුසුකම් තක්සේරු කිරීමේදී වර්තමාන සිදුවීම් නිසි ලෙස සැලකිල්ලට ගන්නා ලෙස යුරෝපා කොමිසමෙන් සහ යුරෝපීය විදේශීය ක්‍රියාකාරී සේවයෙන් (European External Action Service - EEAS) ඉල්ලා සිටී. තවද ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ගරුකිරීම දියුණු කිරීම සහ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත අවලංගු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා ඉල්ලා සිටීමට තෙරපුමක් ලෙස ජීඑස්පී+ සහනය භාවිත කරන ලෙසත් ඉල්ලා සිටී; අවසාන පියවරක් ලෙස ශ්‍රී ලංකාවට ලබා දී ඇති ජීඑස්පී+ තත්ත්වය සහ එයින් ලැබෙන ප්‍රතිලාභ තාවකාලිකව ඉවත් කර ගැනීම සඳහා වන ක්‍රියා පටිපාටියක් ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් හේතුවක් තිබේද යන්න ප්‍රවේශමෙන් තක්සේරු කිරීමට සහ හැකි ඉක්මනින් මේ පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තා කිරීමට කටයුතු කරන ලෙස ලෙස කොමිසමෙන් සහ යුරෝපීය විදේශීය ක්‍රියාකාරී සේවයෙන් තවදුරටත් ඉල්ලා සිටී.

මෙම යෝජනාව සම්මත වීම, පුරවැසියන්ගේ අදහස් පළ කිරීමේ නිදහස ඇතුළු අයිතිවාසිකම්වලට ගරු නොකිරීම හේතුවෙන් ශ්‍රී ලංකාවට බරපතළ ආර්ථික අර්බුදයකට මුහුණපෑමට සිදු වන බවට ප්‍රබල සංඥාවක් වූ අතර, ඒ සම්බන්ධයෙන් රජය ගමන් ගනිමින් සිටින දිශානතිය වෙනස් කිරීමට ප්‍රබල තෙරපුමක් ඇති කළේය.

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වසර ගණනාවක් සිරගත කර සිටින රැඳවියන් නිදහස් කිරීම කෙරෙහි අවධානය යොමු වීම, වසරක් අධිකරණය ඉදිරියේ චෝදනා ගොනු කිරීමකින් තොරව රඳවාගෙන සිටි අහ්නාෆ් ජසීම් කවියා අධිකරණයට ඉදිරිපත් කිරීම ආදී පියවර මෙම තෙරපුමෙහි ප්‍රතිඵල ලෙස සැලකිය හැකිය.

2. **ජනමාධ්‍යවේදීන් සඳහා රජය මගින් රක්ෂණාවරණයක් හඳුන්වා දීම.**

ජනමාධ්‍යවේදීන් සඳහා හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයක් එක් වර්ෂයක් සඳහා පමණක් නොමිලයේ ලබා දීමේ වැඩපිළිවෙළක් රජය ආරම්භ කර තිබේ. ''ඇසිදිසි හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණ යෝජනාක්‍රමය'' යනුවෙන් නම් කොට ඇති මෙම රක්ෂණය සඳහා අයදුම්පත් ඉදිරිපත් කරන ලෙස ජනමාධ්‍ය අමාත්‍යාංශය ජුනි 10 සිට ජුනි 30 දක්වා කාලය ලබා දී තිබුණු අතර, ජුනි 30 වැනිද නිකුත් කළ නිවේදනයක් මගින් එම කාලය ජූලි 20 වැනිද දක්වා දීර්ඝ කර තිබේ. රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුව මගින් නිකුත් කළ වලංගු හැඳුනුම්පතක් හිමි ජනමාධ්‍යවේදීන් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ලබන බවද අදාළ නිවේදනයෙහි සඳහන් වේ. (මූලාශ්‍රය: එම නිවේදනය)

මාධ්‍යවේදීන්ගේ ආරක්ෂාව මාධ්‍ය නිදහස ශක්තිමත් කරන සාධයකයක් වන අතර මෙම රක්ෂණාවරණය එක් වර්ෂයක් සඳහා හෝ ආරම්භ වීම වැදගත්ය. නමුත්, වසංගත තත්ත්වය හමුවේ පසුගිය වසර එකහමාරක පමණ කාලය තුළ ජනමාධ්‍ය ක්ෂේත්‍රය තුළ විශාල පිරිසකට රැකියා අහිමි වීම, කොන්ත්‍රාත් පදනමින් සේවය කළ මාධ්‍යවේදීන්ගේ කොන්ත්‍රාත් දීර්ඝ නොකිරීම යනාදී හේතු මත රැකියා විරහිතවූ සහ නිදහස් මාධ්‍යවේදීන් ලෙස කටයුතු කරන මාධ්‍යවේදීන්ට මෙම සහනය නොලැබී යෑම සම්බන්ධයෙන් අවධානය යොමු විය යුතුව තිබේ.

3. **වසංගත තත්ත්වය හමුවේ ආර්ථික වශයෙන් දුෂ්කර තත්ත්වයට පත්ව සිටින ප්‍රාදේශීය මාධ්‍යවේදීන් සඳහා, රු. 5000 සහනාධාරය ලබා දෙන ලෙස මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය අගමැතිවරයාගෙන් ඉල්ලා සිටීම.**

වසංගත තත්ත්වය, ගංවතුර හා නායයෑම් හමුවේ ආර්ථික වශයෙන් දුෂ්කර තත්ත්වයට පත්ව සිටින ප්‍රදේශීය මාධ්‍යවේදීන් සඳහාද, වසංගත තත්ත්වය හේතුවෙන් දුෂ්කරතාවට පත් අඩු ආදායම්ලාභීන් වෙනුවෙන් රජය ලබා දෙන රු. 5000 දීමනාව ලබා ලෙස මාධ්‍ය සේවක වෘත්තීය සමිති සම්මේලනය අගමැතිවරයාට ලිපියක් යොමු කරමින් ඉල්ලා සිටියේය.

ප්‍රාදේශීය මාධ්‍යවේදීන් නිසි වැටුපක්, දීමනාවක් පමණක් නොව කිසිදු වෘත්තීය අයිතිවාසිකමකටද හිමිකම් නොකියන නිරන්තරයෙන් පීඩාවට පත් වන වෘත්තීය කණ්ඩායමක් බවත්, පුවත්පත් මුද්‍රණය, අලෙවිය අත්හිටුවා තිබෙන, විද්‍යුත් මාධ්‍ය වාර්තාකරණයද අසීරුව පවතින මොහොතක ඔවුන්ගේ දරු පවුල් බලවත් අසීරුතාවකට පත්ව ඇති බවත් එම ලිපිය මගින් අවධාරණය කර ඇත. අසීරු අවස්ථාවක ප්‍රාදේශීය මාධ්‍යවේදීන් වෙනුවෙන් තාවකාලික සහනයක් අපේක්ෂාවෙන් කළ මෙම ඉල්ලීම මෙතෙක් ඉටු වී නැත.

**වගු අංකය: 05 - මාධ්‍ය නිදහස: 2021 ජනවාරි- ජූනි දක්වා නිදහස් මාධ්‍ය ව්‍යාපාරය වෙත වාර්තා වී ඇති සිදුවීම් සංඛ්‍යාව.**

| ආවරණය කර ඇති සංරචකය | 2021 ජනවාරි - මැයි | 2021 ජූනි |
|---|---|---|
| ආරක්ෂාව හා සුරක්ෂිතබව | 19 | 05 |
| නීතිමය කොන්දේසි | 25 | 04 |
| මාධ්‍ය ස්වාධීනත්වය | 01 | - |
| මාධ්‍ය නිදහස සම්බන්ධ ප්‍රවණතා | 01 | - |
| ව්‍යුහාත්මක කොන්දේසි | - | 03 |
| **එකතුව** | **46** | **12** |

පසුගිය වාර්තා

**පසුසටහන:** සිවිල් සමාජ අපේක්ෂාවන්, ජාතික හා ජාත්‍යන්තර නඩු තීන්දු සහ අන්තර්ජාතික ප්‍රඥප්තීන්ටද අනුව යමින්, මාධ්‍ය නිදහස යනු මානව අයිතියක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. සෑම තැනැත්තකුම සතු සිතීමේ නිදහස, හෘදය සාක්ෂියේ නිදහස සහ ආගමික නිදහස මෙන්ම අන් තැනැත්තන්ගේ මත දැනගැනීමට තිබෙන මූලික අයිතිය බාධාවකින් තොරව භුක්තිවිඳීම මානව අයිතියකි. මෙම පදනම මත පිහිටා මාධ්‍ය නිදහස යනු පහත දැක්වෙන දසවැදෑරුම් සංඝටකවල එකතුවක් ලෙස නිදහස් මාධ්‍ය ව්‍යාපාරය සලකයි. (1) සිතීමේ නිදහස (2) මතයක් දැරීමේ නිදහස (3) භාෂණයේ නිදහස (4) සාමකාමීව රැස්වීමේ නිදහස ඇතුළු අදහස් පළ කිරීමේ නිදහස (5) තොරතුරු දැනගැනීමේ නිදහස (6) ශ්‍රව්‍ය, දෘශ්‍ය පටිගත කිරීමේ සහ වාර්තා තබා ගැනීමේ නිදහස (7) ප්‍රකාශනයේ නිදහස (8) පුවත්පත් නිදහස (9) විද්‍යුත් මාධ්‍ය නිදහස (10) අන්තර්ජාල නිදහස යනු එම සංඝටකයන්ය. මෙම සංඝටක අතර ඇත්තේ සහජීවී සම්බන්ධයක් වන අතර එක් සංඝටකයක ඇති වන සීමාවක් මාධ්‍ය නිදහස පිළිබඳ අනෙක් සියලුම සංඝටකයන් භුක්තිවිඳීමේ නිදහස අහුරන බව නිදහස් මාධ්‍ය ව්‍යාපාරය පිළිගනියි. එමෙන්ම වගකීම් විරහිතව හා වෛරී සහගත ලෙස එම නිදහස භාවිත කිරීම යහපත් භාවිතාවක් නොවන බවද නිදහස් මාධ්‍ය ව්‍යාපාරය අවධාරණය කරයි.

මෙම මාසික වාර්තා පිළියෙල කරනු ලබන්නේ ජනමාධ්‍ය වාර්තා සහ නිදහස් මාධ්‍ය ව්‍යාපාරයට ලබා ගත හැකි තොරතුරු අනුව වැඩිදුර තොරතුරු සොයා එම සිදුවීම් විශ්ලේෂණය කිරීමෙනි. මෙම විශ්ලේෂණයේදි නිදහස් මාධ්‍ය ව්‍යාපාරය ඉහත කී දසවැදෑරුම් මාධ්‍ය නිදහස් සංඝටකයන් ආවරණය කරන ජාත්‍යන්තරව පිළිගත් සංරචකයන් හතක් ඔස්සේ තෝරා ගත් නිර්ණායක භාවිත කරයි.


Free Media Movement

Convener | Seetha Ranjanee +94 77 731 2460 | Secretary | Lasantha De Silva +94 71 166 7938
Treasurer | Thaha Muzammil +94 77 374 1026
No 96, Bernard Soysa Mw, Colombo 05. Tel: +94 112368895 Fax: +94 112368895;
Web: www.fmmsrilanka.lk, www.mediareform.lk
Email: fmmsrilanka@gmail.com|Facebook: https://www.facebook.com/fmm.srilanka
Twitter: https://twitter.com/FMMsrilanka|#FMM25


Layout: iridiumcreations.com